# මොසේක් නිර්මාණ : කරගම්පිටිය සුබෝධාරාම විහාරය ඇසුරින්

**පියුමි ඇඹුල්දෙනිය**

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
piyumiembuldeniya@ymail.com

## හැඳින්වීම

බස්නාහිර පළාතෙහි කොළඹ දිස්ත්‍රික්කයට අයත් දෙහිවල නගරයට ආසන්න කරගම්පිටිය ග්‍රාමයෙහි පිහිටා ඇති කරගම්පිටිය සුබෝධාරාම විහාරස්ථානය පුරාවිද්‍යාත්මක, ඓතිහාසික සහ කලාත්මක යනාදී අංශයන්ගෙන් වැදගත් වන විහාරස්ථානයකි. මෙම විහාරස්ථානය කොළඹ සිට ගාල්ල ප්‍රධාන මාර්ගයෙහි දෙහිවල මංසන්ධියේ සිට මීටර 180ක් පමණ දුරින් කරගම්පිටිය ග්‍රාමයෙහි පිහිටා ඇති බැවින් "කරගම්පිටිය විහාරය" යනුවෙන් සාමාන්‍ය ව්‍යවහාරයේ පවතියි. මෙම විහාරස්ථානය වර්තමානයේ දී ප්‍රතිමාගෘහය, ස්තූපය, බෝධීන්වහන්සේ, ධර්මශාලාව, සණ්ඨාර කුළුණ, ආවාසගෙය, සත්සතිගෙය, ශ්‍රී පාදගෙය ආදී සියලු විහාරාංගයන්ගෙන් සමන්විතය.

කෝට්ටේ රාජධානි යුගයෙහි හයවන පරාක්‍රමබාහු රජ (1412 - 1467) දවස මෙහි ආරම්භය සිදු වූ බව සැලකේ. රජු විසින් පැපිලියානේ නාථ දේවාලයට පූජා කළ "මැදිමාල" නම් ග්‍රාමයෙහි බටහිර කොටස "කරගම්පිටිය" ලෙස හඳුන්වනු ලබන බව ජනප්‍රවාදයේ පවතියි. එ දවස වර්තමාන කරගම්පිටිය විහාරය පිහිටි භූමියෙහි නා ගසක් පාමුල දේවාලයක් ඉදිකර ඇති අතර පෘතුගීසි සමයේදී එම දේවාලය විනාශ කර එහි වූ ශෛලමය කුළුණු දේවස්ථානයක් ඉදිකිරීම සඳහා රැගෙන ගොස් ඇත. ලන්දේසි සමයෙහි දී ලන්දේසි දේවස්ථානයක් සහ අම්බලමක් කරගම්පිටියෙහි ඉදිකර ඇත. පසුව බ්‍රිතාන්‍ය පාලන සමයෙහි දී මෙතෝදිස්ත දේවස්ථානයක් ඉදි කළ අතර එම අවස්ථාවේදී පැරණි කුළුණු නැවත කරගම්පිටිය විහාරය වෙත රැගෙන එන ලදී. කරගම්පිටිය විහාරයේ ඉදිකිරීම් කටයුතු රාජාධිරාජසිංහ රජ දවස (1795) අවසන් කර ඇත. ඒ අනුව මෙම විහාරස්ථානය පෘතුගීසි, ලන්දේසි සහ බ්‍රිතාන්‍ය පාලන සමයන්හි දී වෙනස්වීම්වලට ලක් විය. එහෙයින් ප්‍රතිමාගෘහය අභ්‍යන්තරයෙහි විවිධ යුගවල දී චිත්‍රණය කළ විවිධ ශෛලීන්ට අනුව චිත්‍රණය කළ සිතුවම් ද දක්නට ලැබේ.

මොසේක් කලාව යනු විවිධ හැඩවලින් යුක්ත කුඩා ප්‍රමාණයේ වීදුරු කැබලි, පාෂාණ, ඛනිජ, මැටි බඳුන් කැබලි සහ වෙනත් මාධ්‍යයන් භාවිත කරමින් කරනු ලබන අලංකරණාත්මක කලා නිර්මාණයකි. මොසේක් කලාව සම්බන්ධ ඓතිහාසික පසුබිම අනුව ක්‍රිස්තු පූර්ව යුගය දක්වා අතීතයක් පවතින මෙම නිර්මාණ කලාව විවිධ යුගවල දී ලොව විවිධ කලාප තුළ දී නිරූපිත වස්තු විෂයය අනුව සහ නිර්මාණ ශෛලිය අනුව වර්ධනය වී ඇත.

ශ්‍රී ලංකාව තුළ මොසේක් නිර්මාණ දක්නට ලැබෙන ස්ථාන ඉතා සීමිත වන අතර කරගම්පිටිය සුබෝධාරාම විහාරස්ථානයට අමතරව මඩුවන්වෙල වලව්ව ආශ්‍රිතව මොසේක් නිර්මාණ දක්නට ලැබේ. මඩුවන්වෙල වලව්ව සහ කරගම්පිටිය සුබෝධාරාම විහාරස්ථානය යන ස්ථාන ද්විත්වයෙහිම මොසේක් කලා නිර්මාණ සඳහා භාවිත කර ඇති පිඟන් ගඩොල් කැබලි අතර සමානත්වයක් ද පවතියි.

කරගම්පිටිය සුබෝධාරාම විහාරස්ථානය හා බැඳුණු මොසේක් නිර්මාණ විහාරස්ථානයේ ප්‍රතිමාගෘහය සහ

සත්සතිගෙය ආශ්‍රිතව දැකගත හැකිය. වර්ෂ 1898 දී කරගම්පිටිය සුබෝධාරාම විහාරස්ථානයේ ප්‍රතිමාගෘහයෙහි පොළොව කාසි සහ පිඟන් ගඩොල් කැබලි යොදා අලංකරණය කර ඇත. ඒ අනුව ප්‍රතිමා ගෘහයේ අන්තරාලය කොටසෙහි මණ්ඩපය වෙත පිවිසෙන දොරටු සහිත ඉදිරිපස කොටසෙහි පොළොව මත විවිධ හැඩතලවලින් යුක්ත මොසේක් නිර්මාණ දැකගත හැකිය. එසේම ප්‍රතිමා ගෘහයේ මණ්ඩපය ඇතුළත කොටසෙහි පොළොව මත චතුරස්‍රාකාර කොටස් ආශ්‍රිතව නෙළුම් මල ඇතුළු විවිධ මල් වර්ග, තාරාවා, මොණරා, කුකුළා වැනි පක්ෂීණ් වර්ග, සිංහයා, අලියා, එළුවා, ගෝනා, අශ්වයා, හාවා, කොටියා, නයා, මාළුවා ආදී සත්ත්ව වර්ග, පොල් ගස ඇතුළු වෙනත් ගස් වර්ග, පුන්කළස, කුඩය, මල් බඳුන සහ ඔරලෝසුව වැනි විවිධ රූප මොසේක් කලාව මඟින් නිර්මාණය කර ඇත.

සත්සතිගෙය ආශ්‍රිතව ද පිටත සහ අභ්‍යන්තරයෙහි මොසේක් නිර්මාණ දක්නට ලැබේ. ඒ අනුව ගොඩනැගිල්ලෙහි පිටත ගොතික් ශෛලියේ තොරණ ආශ්‍රිතව සහ ඉදිරිපස අන්තරාලයේ පොළොව මත මොසේක් නිර්මාණ දක්නට ලැබේ. අභ්‍යන්තරයෙහි මුළුමණින්ම පොළොව අලංකරණය සඳහා මොසේක් නිර්මාණ භාවිත කර ඇත. එහි වෘත්ත, චතුරස්‍ර, අෂ්ටාශ්‍ර, පංචාස්‍ර ආදී විවිධ ජ්‍යාමිතික හැඩතල නිර්මාණ දක්නට ලැබේ.

ප්‍රතිමාගෘහය සහ සත්සති ගෙය ආශ්‍රිත මොසේක් නිර්මාණ සඳහා ප්‍රධාන වශයෙන් නිල්, කහ, සුදු යන වර්ණ නියෝජනය කරනු ලබන පිඟන් ගඩොල් කැබලි ද එම වර්ණවලට අමතරව රතු, කොළණ දුඹුරු, තැඹිලි සහ කළු යන වර්ණ නියෝජනය කරනු ලබන පිඟන් ගඩොල් කැබලි ද භාවිතා කර ඇත. එසේම පක්ෂීණ්, විවිධ පලතුරු සහ මල් වර්ග දැක්වෙන පිඟන් ගඩොල් කැබලි ද භාවිතා කර ඇත. විශේෂයෙන් වෘත්තාකාර හැඩැති පිඟන් ගඩොල් කැබලි මධ්‍යයේ ඉස්ලාම් සංස්කෘතියට අයත් සංකේතය, සිංහ රුව සහ මල් වර්ග නිරූපිත මෝස්තර දක්නට ලැබේ.

## පර්යේෂණ අරමුණු

මොසේක් නිර්මාණයන්හි ඓතිහාසික ස්වභාවය පිළිබඳ අවධානය යොමුකරමින් සුබෝධාරාම විහාරස්ථානය ඇසුරින් මොසේක් නිර්මාණ පිළිබඳව අධ්‍යයනය කිරීම, විහාරස්ථානයේ ඓතිහාසිකත්වය සහ එහි දක්නට ලැබෙන මොසේක් නිර්මාණවල ශෛලිය අධ්‍යයනය කිරීම සහ මොසේක් නිර්මාණ හරහා පිළිබිඹු වන විදේශීය ආභාසයන් හඳුනා ගැනීම යන අංශ කෙරෙහි අවධානය යොමුකිරීමට අපේක්ෂිතය.

තවද වර්තමානයේ දී කරගම්පිටිය සුබෝධාරාම විහාරයේ සත්සතිගෙය ආශ්‍රිත මොසේක් නිර්මාණ ස්වභාවික ක්‍රියාකාරකම් සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් හායන තත්ත්වයකට මුහුණ පා ඇති හෙයින් ශ්‍රී ලාංකීය කලා ඉතිහාසය තුළ ඉතා සීමිත කලා නිර්මාණ විශේෂයක් මෙන්ම විදේශීය ආභාසය සහ දේශීයත්වය මිශ්‍ර වූ මොසේක් නිර්මාණ ආරක්ෂා කරගැනීම සඳහා මෙම පත්‍රිකාවෙන් යෝජනාවන් ද ඉදිරිපත් කෙරෙනු ඇති

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ දී ප්‍රධාන වශයෙන් පර්යේෂණ ක්‍රමවේද ද්විත්වයක් භාවිත කරන ලදී. ඒ අනුව මොසේක් කලාව සම්බන්ධ ඓතිහාසික පසුබිම සහ විහාරස්ථානයෙහි ඓතිහාසික පසුබිම අධ්‍යයනය සඳහා පුස්තකාල අධ්‍යයන ක්‍රමවේදයත් කරගම්පිටිය සුබෝධාරාම විහාරයේ මොසේක් නිර්මාණ පිළිබඳව අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය ත් යොදාගනු ලැබිණි.

### ආශ්‍රේය ග්‍රන්ථ


චුටිවොංග්ස්, නන්දන සහ ප්‍රේමතිලක, ලීලානන්ද සහ සිල්වා, රෝලන්ඩ්., 1990, ශ්‍රී ලංකා බිතුසිතුවම් - කරගම්පිටිය, ශ්‍රී ලංකා පුරාවිද්‍යා අධිකාරිය ශත සංවත්සර ප්‍රකාශන, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.

Bandaranayaka, Senake., 2006, The Rock and Wall Painting of Sri Lanka, Stamford Lake Publication, Pannipitiya.

The New Encyclopaedia Britanicca - Volume 8, 2010, Encyclopaedia Britanicca Inc, Chicago.

Mosaic, http://en.wikipedia.org/wiki/Mosaic, 2013. 09. 20

ක්ෂේත්‍ර අධ්‍යයනය - කරගම්පිටිය සුබෝධාරාම විහාරය.